# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2022.12.06

වේලාව : පෙ.ව.9.30

ස්ථානය : ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාව

මූලාසනය : **ජේ.එම්.සී.ජයන්ති විජේතුංග මහත්මිය (ප්‍රධාන ලේකම්)**

## සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය

01) පී.සෝමසිරි මහතා - ආණ්ඩුකාර ලේකම්

02) තිලක් සෙනරත් මහතා - ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන්සභාව(බ.ප)

03) යූ.බී.ආර්.රාජපක්ෂ මහතා - සභා ලේකම්,සභා ලේකම් කාර්යාලය(බ.ප)

04) ඒ.ඩී.එස්.සදීකා මිය - ලේකම්,පළාත් පාලන අමාත්‍යංශය(බ.ප)

05) සිරිසෝම ලොකුවිතාන මහතා - ලේකම්,අධ්‍යාපන අමාත්‍යංශය(බ.ප)

06) ගාමිණී ධර්මසේන මහතා - ලේකම්,සෞඛ්‍ය අමාත්‍යංශය(බ.ප)

07) චන්දන රණවීර ආරච්චි මහතා - ලේකම්,කෘෂිකර්ම අමාත්‍යංශය(බ.ප)

08) ඩබ්ලිව්.එම්.දයාවතී මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)

09) ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)

10) ඒ.එම්.එස්.මල්කාන්ති මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)

11) කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මහතා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)

12) ජී.ඩබ්ලිව්.පී.පෙරේරා මිය - වැ.බ. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)

13) පාලිත අබේවර්ධන මහතා - ප්‍රධාන නීති නිලධාරී

14) එම්.ඩී.ලක්මාලි ජයසේකර මිය - සහකාර ලේකම් -ප්‍රවාහන හා මාර්ග අමාත්‍යංශය (බ.ප)

15) කේ.එන්.සූරියආරච්චි මිය - සහකාර ප්‍රධාන ලේකම් (පාලන)

ප්‍රධාන ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් පැවති ලේකම්වරුන්ගේ රැස්වීමේදී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01 | කෘෂි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ගෙවතුවගා තරඟාවලිය පැවැත්වීම | කෘෂි කර්ම අමාත්‍යාංශය මගින් ගෙවතු වගා ව්‍යාපෘතිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ ගෙවතු 89250ක්, ගම්පහ දිස්ත්‍රික්කයේ ගෙවතු 85563ක් සහ කළුතර දිස්ත්‍රික්කයේ ගෙවතු 73482ක් වගා කටයුතු සිදු කර ඇති බව ප්‍රකාශ කෙරුණ අතර ඒවායෙහි වගා කටයුතු නිසි අධීක්ෂණයක් සහිතව අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>කෘෂි කර්ම අමාත්‍යාංශ ලේකම් විසින් ගෙවතු වගා තරඟාවලිය සම්බන්ධව තොරතුරු ඉදිරිපත් කරමින් ආයතන සඳහා පවත්වන ලද තරඟාවලියේ ප්‍රථම ස්ථානය මතුගම ප්‍රාදේශිය සභාව හිමිකරගෙන ඇති බවත් මෙම තරඟාවලියේ ප්‍රථම .දෙවන හා තෙවන ස්ථාන සඳහා මෙන්ම කුසලතා ත්‍යාග පිරිනැමීම මතුගම ප්‍රාදේශිය සභා වගා භූමිය කේන්ද්‍ර කර ගනිමින් සිදු කිරීමට බලාපොරොත්තු වන අතර එම ත්‍යාග ප්‍රධානෝත්සවය සඳහා ආණ්ඩුකාරතුමාගෙන් දිනයක් වෙන් කර ගැනිමට කටයුතු කරමින් සිටින බවත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් සඳහන් කරන ලදී.<br>තවද අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් පවත්වන ලද ගෙවතු වගා තරඟාවලියේ ජයග්‍රාහිකයින් වෙනුවෙන් 2022.12.16 දින ත්‍යාග ලබා දීමට කටයුතු සංවිධානය කර ඇති බව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | ලේකම්, කෘෂි කර්ම/ අධ්‍යාපන අමාත්‍යාංශ |
| 02 | නඩත්තු කටයුතු සඳහා වෙන්කළ ප්‍රතිපාදන වැයකිරීම සම්බන්ධව | පළාත් සහා නඩත්තු කටයුතු සම්බන්ධව වෙන්කර ඇති මුදල් වැය කිරීම සඳහා ප්‍රගතිය ලබා ගැනීමට පරිගණක දත්ත පද්ධතියන් සකස් කර ඇති බවත් 2023 වසරට ප්‍රතිපාදන සඳහා වෙන්කර ඇති රුපියල් මිලියන 2528 ක තොරතුරු මෙම දත්ත පද්ධතියට ඇතුලත් කරමින් පවතින අතර 2023 ජනවාරි අග වන විට එය සිදුකර අවසන් කල හැකි බවත් , 2022 වසරට අදාළ රුපියල් මිලියන 1553 හි තොරතුරු සඳහා අමාත්‍යාංශ වලින් දත්ත ඇතුලත් කරමින් පවතින බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| | | තවද ප්‍රවාහන අමාත්‍යාංශයට අයත් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා වැඩිපුර ලබා දීඇති රු. මිලියන 800 ක මුදලින් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් බස් නැවතුම් පොළවල් සකස් කිරීම සම්බන්ධව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් විමසා සිටින ලදී.ඒ පිළිබඳ වැඩි දුරටත් සාකච්ඡා කල අතර පළාතට අයත් අභ්‍යන්තරික කටයුත්තක් බැවින් එය සිදු කිරීම සඳහා තොරතුරු ලබා ගන්නා ලෙස එම ආයතනයට දැනුම් දෙන ලෙස ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී. | ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය. |

| | | | |
|---|---|---|---|
| 03 | We green වෙළඳ සැල පවත්වාගෙන යාම කෘෂි සේවා අධිකාරියට පැවරීම සම්බන්ධව | මේ වන විට කෘෂි කර්ම දෙපාර්තමේන්තු සුහ සාධක සංගමය මඟින් පවත්වාගෙන යනු ලබන We green වෙළඳ සැල 2023 ජනවාරි මස සිට කෘෂි සේවා අධිකාරියට පැවරීම සම්බන්ධව සාකච්ඡා කර ඇති බව කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.ඒ අනුව ඉදිරි කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලදී.<br><br>ඒ අනුව ආයුර්වේද සංස්ථාවේ වෙළඳ සැල පවත්වාගෙන ගිය වෙළඳ කුටියද We green වෙළඳ සැලට ඒකාබද්ධ කර තව දුරටත් වැඩි දියුණු කර පවත්වාගෙන යාමට ඇති හැකියාවද සොයා බලා ඒ අනුව කටයුතු කරන ලෙස වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශ |
| 04. | සේවක ස්ථාන මාරු ක්‍රියාවලිය සම්බන්ධව | සේවක ස්ථාන මාරු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ආයතන ප්‍රධානීන් වෙත පවරා ඇති බලතල ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත පවරා දීමට කටයුතු කරන ලෙස පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැනුම් දීමට කටයුතු කර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු ) විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>ඒ අනුව සේවක ස්ථාන මාරු ක්‍රියාවලිය සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කළ අතර රටේ පවතින ආර්ථික තත්ත්වය හා පුද්ගලයෙකුට දෛනික කටයුතු පවත්වාගෙන යාමට දැරීමට සිදුව ඇති වැය බර පිළිබඳ සලකා බලා මේ සම්බන්ධයෙන් මානුෂියව ක්‍රියා කල යුතු බව ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව නිලධාරීන්ගේ පහසුව පිළිබඳ සලකා බලා ඔවුන් අපහසුතාවට පත් නොවන පරිදි ලැබෙන ඉල්ලීම් අනුව සංවේදීව ස්ථානමාරු ක්‍රියාවලිය සිදු කිරීම සුදුසු බවට ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 05. | ආපදා ණය ලබා දීම සම්බන්ධව | කලාප කාර්යාලවල ආපදා ණය ලබා දීමේදී විවිධ අක්‍රමිකතා හා ණය ඉල්ලුම් කරන නිලධාරීන්හට අපහසුතාවට පත්වන අන්දමේ ක්‍රියා පවතින බව ප්‍රධාන ලේකම් විසින් පෙන්වා දෙන ලදී.<br><br>ආපදා ණය ගෙවීම් කිසිදු ප්‍රමාදයකින් තොරව ලබා දීමට හැකිවන පරිදි ප්‍රතිපාදන වෙන්කර ඇති බැවින් නිලධාරීන් අපහසුතාවට පත් නොකර ආපදා ණය ඉල්ලුම් කරුවන් වෙත අදාළ ණය මුදල් ලබා දීමට කටයුතු කරන ලෙස කලාප අධ්‍යක්ෂවරුන් හා කලාප කාර්යාලවල ගණකාධිකාරීවරුන් දැනුවත් කර ලිපියක් යොමු කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) වෙත උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |

| | | | |
|---|---|---|---|
| 06. | පරිගණක අළුත් වැඩියා කිරීමෙන් පසු ඉවත් කරන කොටස් සම්බන්ධව කටයුතු කිරීම | පරිගණක අළුත් වැඩියා කිරීමෙන් පසු ඉවත් කරන කොටස් තොරතුරු තාක්ෂණ සම්පත් අධිකාරිය විසින්ම බැහැර කිරීමට මේවන විට කටයුතු කර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් ප්‍රකාශ කරන ලදී.<br>ඒ අනුව යම් අක්‍රමිකතාවක් සිදුවීම වැලැක්වීම සඳහා විනිවිද භාවයකින් එම කටයුතු සිදුකල යුතු බැවින් එම ඉවත් කරන කොටස් සම්බන්ධව ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරන ලෙස තොරතුරු තාක්ෂණ සම්පත් අධිකාරියට උපදෙස් ලබා දෙන ලෙස ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය ) |
| | | නව යෝජනා | |
| 07. | ඒත්තුකාල පේෂ කර්මාන්ත මධ්‍යස්ථානය පිහිටා ඇති ඉඩම අත්පත් කර ගැනීමට අදාළ වන්දි ගෙවීම සම්බන්ධව | වසර 42ක කාලයක් පුරා ඒත්තුකාල පේෂ කර්මාන්ත මධ්‍යස්ථානය පිහිටා ඇති ඉඩම එම ආයතනයට භුක්තිය බාර දීම සම්බන්ධයෙන් පැවරුම් ලේඛනයේ සටහන්ව ඇත. එම ආයතනයට මෙම ඉඩම පැවරී නොමැති බවට ඇති පදනම මත අත්පත්කර ගැනීමට ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා රු.79600000 ක් (රුපියල් හත්කෝටි අනූ හය ලක්ෂයක් ) ගෙවීමට අවශ්‍ය බව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ප්‍රකාශ කර බව එම අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා ඇති බවත් මේ වන විට එම මුදලට වැඩි වටිනාකමක් ඔවුන් විසින් ඉල්ලුම් කරනු ලබන බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව මේ සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් පසුව එවැනි අධික මුදලක් ගෙවීමට හැකියාවක් නොමැති බැවින් මෙතෙක් තිබූ පරිදිම ඉදිරියටත් මෙම ඉඩමෙහි කර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත් මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සුදුසු බවට තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 08. | රක්ෂණාවරණයෙන් ආවරණය වන වත්කම් උපකරණ සම්බන්ධව | රක්ෂණාවරණයෙන් ආවරණය වන වත්කම් උපකරණ සම්බන්ධව ගොඩනැගිල්ල තුල පවතින ආයතන දැනුවත් කරන ලෙස අභ්‍යන්තර විගණන අංශය මඟින් දැනුම් දී ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව වත්කම් කළමනාකරණ පද්ධතිය හරහා අමාත්‍යාංශ වලට ලබා දී ඇති ලයිස්තුවට ඇතුලත්ව ඇති සියලුම වත්කම් මෙම රක්ෂණාවරණයට අයත්වන බවට සියලුම ලේකම්වරුන් දැනුවත් කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |
| 09. | තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ප්‍රකාරව විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධව | 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිනම් පනතට නව චක්‍රලේඛයක් නිකුත් කර ඇති බවත් එහි සඳහන් කරුණු ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව පිළිබඳ සියලුම ලේකම්වරුන් දැනුවත් කිරීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව එවා ඇති චක්‍රලේඛයේ සඳහන් නව කරුණු පිළිබඳ අමාත්‍යාංශ ලේකම් වරුන් වෙත ලිඛිතව දන්වා යවා ඒ සම්බන්ධව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු , හා අනෙකුත් ආයතන මඟින් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා ලබා ගන්නා ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |

| | | | |
|---|---|---|---|
| 10. | කඩුවෙල කොරතොට මයික්වත්ත ඉඩම වගා කටයුතු සඳහා යොදා ගැනීම සම්බන්ධව | කඩුවෙල කොරතොට මයික්වත්ත ඉඩම වගා කටයුතු සඳහා යොදා ගැනීම සම්බන්ධව කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කර ඇති සැලැස්ම සම්බන්ධව සාකච්ඡා කරන ලදී.ඒ අනුව කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් ඉදිරිපත් කර තිබූ පාංශු සංරක්ෂණ ක්‍රියාවලිය හා ඊට අදාළ කාර්යයන් සඳහා වූ රු.මි.13.5 ක ඇස්තමේන්තුව ඉතා වැඩි බැවින් හා එයින් ලැබිය හැකි ප්‍රතිලාභ අවම බැවින් එය ඵලදායි නොවන බවත් ඒ අනුව වෙනත් කටයුත්තක් සඳහා සලකා බලන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>මේ වන විට විශාල මුදලක් වැයකර එම ඉඩම සූද්ද පවිත්‍ර කර ඇති බැවින් එහි සිදුකල හැකි විවිධ කටයුතු සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 11. | අලෙවි කටයුතු සඳහා ප්‍රධාන පිවිසුම් ආලින්දය ලබා දීම සම්බන්ධව | පළාත් සභා ගොඩනැගිල්ලේ ඉදිරිපස පිහිටි ප්‍රධාන පිවිසුම් ආලින්දය අලෙවි කටයුතු සඳහා ලබා දීමේදී සේවා ලබා ගැනීමට පැමිණෙන මහජනතාව අපහසුතාවට පත්වීම කාර්යාලවල නිලධාරීන් නිරන්තරයෙන් එහි රැඳී සිටීම වැනි ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීමෙන් පසු ඉදිරියේදී ගොඩනැගිල්ලේ ඉදිරි පිවිසුම් ආලින්දය අලෙවි කටයුතු සඳහා ලබා නොදීමටත් අවශ්‍යනම් ගොඩනැගිල්ල් පිටුපස පිවිසුම් ආලින්දය ලබා දීම සුදුසු බවත් තීරණය කරන ලදී.<br>තවද අලෙවි කුටි පැවැත්වෙන දිනයන් වලදී කාර්යාලවල නිලධාරීන් නිතර එම අලෙවි කුටිවල රැඳී සිටින බව නිරීක්ෂණය වන බැවින් කාර්යාලවල නිලධාරීන්ට භාණ්ඩ මිලදී ගැනීම සඳහා නියමිත වේලාවකදී පමණක් කාර්යාල වලින් බැහැර යැවීම සම්බන්ධව සියලු ආයතන දැනුවත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 12. | විගණන විමසුම් සඳහා පිළිතුරු ලිවීම සම්බන්ධව | විගණන විමසුම් සඳහා 2020 වසර දක්වා නිකුත් කර ඇති විගණන විමසුම් පොත මේ වන විට තමා වෙත ලැබී ඇති බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් ප්‍රකාශ කරන ලදී.ඒ අනුව සියලුම අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා අනිකුත් ආයතනවලට සති තුනක් ඇතුලත පිළිතුරු සපයන ලෙස ඔවුන්ට අයත් විගණන විමසුම් කොටස් සමඟ ලිඛිතව දන්වා යවන ලෙසද ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>තවද විගණන විමසුම් වල අදාළ කරුණට අනුව හොඳින් පරීක්ෂාකර සංෂිප්තව පිළිතුරු ලබා දීමට කටයුතු කරන ලෙසද ප්‍රධාන ලේකම් විසින් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් දැනුවත් කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)<br><br>සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |

| | | | |
|---|---|---|---|
| 13. | වාර්ෂිකව ආපන ශාලාවේ උපකරණ සේවා කිරීම සම්බන්ධව | ආපන ශාලාවට අයත් උපකරණ හා භාණ්ඩ සේවා ගිවිසුම් අනුව වසරකට දෙවරක් සේවා කිරීමට සිදුවන අතර ඒ සඳහා වන මිල ගණන් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය මගින් ඉදිරිපත් කර ඇති බව සහකාර ප්‍රධාන ලේකම් (පාලන) විසින් පවසන ලදී.<br><br>කෙසේ වෙතත් ඉහල වටිනාකමක් ගෙවා මිල දී ගෙන ඇති භාණ්ඩ හා උපකරණ සේවා කිරීම අත්‍යාවශ්‍ය බවට කරුණු ඉදිරිපත් කරන ලදී . දළ වශයෙන් මෙම මහලෙහි මාසික විදුලි බිල ලක්ෂ පහක් පමණ වන බවත් ලබා ගන්නා වූ ප්‍රතිලාභ ඉතා අවම වන බවත් තව දුරටත් සාකච්ඡා විය. දැනට ආපන ශාලාව පවත්වාගෙන යනු ලබන කෘෂිකර්ම අමාත්‍යාංශයේ සුභ සාධක සංගමය සමග වූ ගිවිසුම් කාල සීමාව නිමවූ පසු ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් නව සැපයුම් කරුවෙකු තෝරා ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | ප්‍රධාන නීති නිලධාරී<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 14. | බස්නාහිර පළාත් සභාවට අයත් ආයතන සතු ඉඩම්වල අයිතිය සම්බන්ධව | පළාත් සභා කාර්යාල පවත්වාගෙන යන බොහොමයක් ඉඩම් භුක්ති විදීමේ අයිතිය පමණක් ඇති අතර බොහෝ ප්‍රමාණයක් ඉඩම්වල අයිතිය පැවරී නොමැති බව සාකච්ඡා කරන ලදී.<br><br>විශේෂයෙන් පළාත් සභා අමාත්‍යාංශවලට අයත් ප්‍රාදේශීය කාර්යාල පවත්වාගෙන යන ඉඩම්වල අයිතිය එම ආයතන සතු නොවේ.ජනාධිපති කාර්යාලයේදී පැවති රැස්වීමකදී මේ සම්බන්ධව එම ආයතනවල අවධානය යොමු කරවන ලෙස දැනුම් දීඇත.එබැවින් මෙම ඉඩම්වල අයිතිය විධිමත් පැවරුම් කරණයකින් ලබාදෙන ලෙස අදාළ ආයතන වෙතින් ලිඛිත ඉල්ලීමක් සිදුකරන ලෙස පළාත් ඉඩම් කොමසාරිස් වෙත පිටපත් සහිතව ආයතන විධිමත්ව දැනුවත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 15. | බස්නාහිර පළාත් අමාත්‍යාංශවලට අයත් අධිකාරීවල සැලසුම් පිළියෙල කිරීම | බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ වලට අයත් සියලුම අධිකාරි වෙත වෙන වෙනම 2022 වර්ෂය වෙනුවෙන් වාර්ෂික වාර්තාවක් පිළියෙල කලයුතු අතර 2022 දෙසැම්බර් 31 දක්වා වන සංයුක්ත සැලැස්මක් සකස් කර 2023.01.15 දිනට පෙර ඉදිරිපත් කල යුතු බව සියලුම අධිකාරීන් දැනුවත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) වෙත දන්වන ලදී.<br><br>තවද අමාත්‍යාංශ වලින් සකස් කරන ක්‍රියාත්මක සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම , හා පස් අවුරුදු සැලැස්ම පදනම් කරගෙන එම ක්‍රමවේදයන්ට අනුව සෑම අධිකාරියක් විසින්ම ආයතනික සැලැස්මක් සකස්කර ඉදිරිපත් කල යුතු බවද අධිකාරීන් වෙත ලිඛිතව දැනුම් දෙන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) වෙත ප්‍රධාන ලේකම් විසින් වැඩි දුරටත් දන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

| | | | |
|---|---|---|---|
| 16. | බස්නාහිර පළාත් සභා අධිකාරීවල විනය කටයුතු සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවට අයත් අධිකාරී හා මණ්ඩලවල විනය බලධාරිත්වය නිශ්චිත නොවීමේ ගැටළුවක් පවතින බවට ප්‍රධාන ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>ඒ අනුව පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් බස්නාහිර පළාත් මූල්‍ය රීති ද පිළිගෙන එම ආයතනය විසින් ආයතන සංග්‍රහය මූලික කරගෙන විනය කටයුතු සිදු කරනු ලබයි. අනෙකුත් අධිකාරී මණ්ඩලවල එවැනි වැඩ පිළිවෙලක් දක්නට නොමැති බවු ප්‍රධාන ලේකම් විසින් වැඩිදුරටත් අවධාරණය කරන ලදී.<br><br>ඒ අනුව මීළඟ ප්‍රඥප්ති කමිටුවේදී විනය කාර්ය පටිපාටි සකස් කිරිම සම්බන්ධව සාකච්ඡා කිරීම සුදුසු බව තීරණය කරන ලදී. | ප්‍රධාන නීති නිලධාරි |
| 17. | කණිෂ්ඨ සේවක උසස් වීම් සඳහා ලබා දෙන ලකුණු සීමාව සම්බන්ධව | කණිෂ්ඨ සේවකයන් අතරින් කළමනාකරණ සේවා නිලධාරීන් පත් කිරීම සඳහා පවත්වන ලද තරඟ විභාගයෙන් නිලධාරීන් තෝරා ගන්නා ලකුණු මට්ටම 80 දක්වා අඩු කරන ලෙස තමා වෙත ඉල්ලීමක් ඉදිරිපත්ව ඇති බවට ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>ඒ අනුව ඒ පිළිබඳව කරුණු දක්වමින් කණිෂ්ඨ සේවක උසස්වීම් සඳහා පවත්වන ලද විභාගයෙන් එක් විෂයකට ලකුණු40 කට වැඩි හා මුළු ලකුණු 100 දක්වා ලබාගත් පිරිසට පමණක් පත්වීම් ලබා දීම නීත්‍යානුකූල බවත් , ලකුණු 104 දක්වා ලබාගත් පිරිසට මේවන විට පත්වීම් ලබා දීමට කටයුතු කර ඇති අතර ලකුණු 80 දක්වා ලබාගත් අය සඳහා පත්වීම් ලබා දීමට නීත්‍යානුකූල හැකියාවක් නොමැති බවත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් ප්‍රකාශ කර සිටියේ ය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 18. | රජයේ විගණකවරුන් වෙත විගණන කටයුතු සඳහා ඉඩක් වෙන්කර දීම සම්බන්ධව | විගණන කටයුතු සඳහා විගණකවරුන් හතර දෙනෙකුට කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් හා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඉඩක් වෙන්කර දෙන ලෙස රජයේ විගණන අංශයෙන් ඉල්ලීමක් සිදුකර ඇති අතර එවැනි පිරිසකට ලබා දීමට ප්‍රමාණවත් ඉඩ ප්‍රමාණයක් එම අමාත්‍යාංශවල නොමැති බැවින් මූල්‍ය අංශයේ විගණන අංශය වෙනුවෙන් වෙන්කර ඇති කොටස ආශ්‍රයෙන්ම ඉඩක් වෙන්කර දීමේ හැකියාව පිළිබඳ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය ) වෙතින් විමසා සිටි අතර එම ස්ථානයට ගොස් ඉඩකඩ ප්‍රමාණය පිළිබඳ පරික්ෂාකර බලා තීරණයක් ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය ) |

| | | | |
|---|---|---|---|
| 19. | 2022 වර්ෂයේ සිද්ධකළ ව්‍යාපෘති සම්බන්ධ ප්‍රගතිය | 2022 වර්ෂයේ ව්‍යාපෘතිවලට අදාළ ප්‍රගතිය සම්බන්ධව කරුණු ඉදිරිපත් කරමින් සියලුම අමාත්‍යාංශ 90% ක ප්‍රගතියකට ලගා වී ඇති බවත්, වාරි ව්‍යාපෘති සම්බන්ධව ගැටළුවක් පවතින අතර එය 35% ක ප්‍රතිශතයකට හෝ මේ වන විටත් ලඟා වී නොමැති බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් කරුණු දක්වා සිටින ලදී.<br><br>මේ කරුණු පිළිබඳ අදහස් දක්වමින් එසේ සිදු වීමට භාණ්ඩ මිල උච්ඡාවචනය බලපා ඇති බවත් මේ වන විට එම කටයුතු ආරම්භ කර ඇති අතර 2022 වර්ෂය නිම වීමට පෙර 90% ක ඉලක්කයට ලඟා වීමට හැකිවන බව වාරි මාර්ග අධ්‍යක්ෂ විසින් දන්වා ඇති බවත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් කරුණු ඉදිරිපත් කර අතර ඒ සම්බන්ධව තව දුරටත් ඔවුන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ද ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී.<br><br>තවද 2023 වර්ෂයට අපේක්ෂිත ප්‍රතිපාදන ලබා ගැනීමට අදාළව පස් අවුරුදු සැලැස්ම පදනම් කරගෙන ආයතනික ප්‍රාග්ධන සැලැස්ම , ප්‍රසම්පාදන සැලැස්ම , ක්‍රියාත්මක සැලැස්ම හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස්කර 2022 දෙසැම්බර් අවසාන වන විට ලබා දෙන ලෙස සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් දැනුවත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 20. | කාර්යාලවල කටයුතු සිදු කිරීම සම්බන්ධව නිලධාරීන් දැනුවත් කිරීම | තවද අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතනවල දුරකතන වලට පිළිතුරු ලබා දීම කෙරෙහි සැලකිලිමත්වන ලෙසත් , ආචාරශීලී ලෙස දුරකතන ඇමතුම් සඳහා පිළිතුරු දීමට නිලධාරීන් කිහිප දෙනෙකු පුහුණු කිරීමට හෝ යම් විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමට පියවර ගන්නා ලෙස හා කාර්යාල කාර්ය සහයකවරුන් දුරකතන ඇමතුම් සඳහා පිළිතුරු ලබා දීමේ දී ආචාරශීලී ලෙස පිළිතුරු ලබා දීම කෙරෙහි තව දුරටත් දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙසත් ප්‍රධාන ලේකම් විසින් සියලුම ලේකම්වරුන් දැනුවත් කරන ලදී.<br><br>එමෙන්ම අමාත්‍යාංශ ලේකම්වරුන් වශයෙන් සම්පූර්ණයෙන් එම විෂයන් සම්බන්ධව තීන්දු තීරණ ගෙන අවසාන ක්‍රියාවලියට බලපෑම් ඇතිකරන නිලධාරීන් වශයෙන් තම විෂය පථය හා ක්ෂේත්‍රය සම්බන්ධව අධ්‍යයනය කර කටයුතු කලයුතු බවට ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී.<br><br>එසේම අල්ලස් ගැනීම වැනි අක්‍රමිකතා සිදු නොවීමට වග බලා ගන්නා ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

| | | | |
|---|---|---|---|
| 21. | ඉංජිනේරු අංශයේ පරිගණක පුහුණු සඳහා සහභාගී වූ නිලධාරීන්ට සංයුක්ත දීමනා ලබා දීම සම්බන්ධව | ප්‍රාදේශිය ඉංජිනේරු කාර්යාලවල නිලධාරීන් තොරතුරු තාක්ෂණ සම්පත් අධිකාරිය වෙතින් පවත්වන ලද පරිගණක පුහුණු පාඨමාලාවකට සහභාගී වූ අතර ඒ සඳහා ඔවුන්ට උදෑසන හා සවස තේ හා කෙටි ආහාරයක් ලබා දීමට කටයුතු කළ අතර දිවා ආහාරය ලබා නොදුන් බවත් , ගමන් වියදම් ලබා දීමට කටයුතු කළ අතර ඔවුන් විසින් එම සහභාගී වීම වෙනුවෙන් සංයුක්ත දිමනාවක් ඉල්ලා සිටින බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් කරුණු දක්වා සිටින ලදී.<br><br>ඒ අනුව ඔවුන්ට දිවා ආහාරය ලබා දී නොමැති බැවින් හා ඔවුන් පැය 6 ක කාලයක් එම කාර්යයෙහි යෙදී ඇති බවට තහවුරු කරගත හැකිනම් සංයුක්ත දීමනාවෙන් අඩක් ගෙවීම් කල හැකි බවට ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 22 | 2023 වසර සඳහා ඇමතුම් දින පොත් හා දින දර්ශන ලබා දීම සම්බන්ධව | 2023 වසර සඳහා අවශ්‍ය ඇමතුම් දිනපොත් හා දින දර්ශන මෙවර රජයේ මුද්‍රණාලය මඟින් මුද්‍රණය නොකරන බවට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් දන්වා ඇති අතර ආයතන සඳහා ඒවා භාවිතා කිරීමේ අවශ්‍යතාව සම්බන්ධව කරුණු සාකච්ඡා කරන ලදී.<br><br>ඒ අනුව රජයේ වියදම් කළමනාකරණය පිළිබඳව සලකා බලා ඇමතුම් දිනපොත් පළාත් සභාව මගින් මුද්‍රණය නොකිරිමට හා ඒ සඳහා සටහන් පොත් භාවිතා කිරීමට හෝ Google Fornat එකක් භාවිතා කිරීම සුදුසු බවට සාකච්ඡා කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

ජේ. එම්. සී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම් (බස්නාහිර පළාත)
ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල